රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
**Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government**

ඒකාබද්ධ සේවා අංශය
නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව.

இணைந்த சேவைகள் பிரிவு
சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை.

COMBINED SERVICES DIVISION
*Independence Square, Colombo 07, Sri Lanka*

දුරකථනය / தொலைபேசி / Telephone: **(94) 011- 2694560**
ෆැක්ස් / தொலைநகல் / Fax: **(94) 011- 2692254**
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail: **dgcs@pubad.gov.lk**
වෙබ් අඩවිය / இணையத்தளம் / Web Site: **www.pubad.gov.lk**

මගේ අංකය / எனது இல / My No: R/DO/PER.APP/2020
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2020.05.12

**2018.08.20 වන දින උපාධිධාරී අභ්‍යාසලාභීන් ලෙස බඳවා ගත් රැකියා විරහිත උපාධිධාරීන් සංවර්ධන නිලධාරි සේවයේ III ශ්‍රේණියට පත් කිරීම සහ ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 පන්තිය III ශ්‍රේණිය සහ 2 පන්තිය II ශ්‍රේණියට පත් කිරීම**

උක්ත මැයෙන් නිකුත් කළ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්ගේ 2020.05.04 දිනැති ලිපිය හා බැඳේ.

02. ඒ අනුව නවක පත්වීම්ලාභී සංවර්ධන නිලධාරීන් සහ ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ නිලධාරීන් රාජකාරි භාර ගැනීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය ආයතන ප්‍රධානීන් වෙත පැහැදිලිව දැනුම් දීමට කටයුතු කර ඇත.

03. එහෙත් එම ලිපියේ ලබා දී ඇති උපදෙස් පරිදි රාජකාරි භාරගැනීමේ කටයුතු කිරීමෙන් තොරව සේවා ස්ථාන සංශෝධන සම්බන්ධයෙන් විමසීම් සිදු කරමින් මෙම අමාත්‍යාංශය වෙත නිලධාරීන් පැමිණෙන බව නිරීක්ෂණය වේ. මේ වන විට රජයේ කාර්යාල විවෘත කිරීමට කටයුතු කර ඇත්තේ ඉතා සීමිත නිලධාරීන් ප්‍රමාණයක් පමණක් කැඳවා සේවාව පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය මත පමණක් වන අතර පොදු ප්‍රවාහන සේවා පහසුකම් සලසා ඇත්තේද ඒ සඳහා පමණි. එබැවින් ඉතා අත්‍යාවශ්‍ය කරුණකට හැර, කැඳවීමකින් තොරව මෙම අමාත්‍යාංශය වෙත පැමිණීමෙන් වළකින මෙන් කාරුණිකව දන්වා සිටිමි.

04. තව ද උක්ත ලිපියේ විධිවිධාන පරිදි ආයතන ප්‍රධානීන් ඔබ වෙත රාජකාරි භාර දීම සඳහා කටයුතු සලසා දෙන තෙක් ඒ පිළිබඳව සාවධානව කටයුතු කරන මෙන් ද, සේවා ස්ථාන සංශෝධන සම්බන්ධයෙන් යම් විමසීමක් වෙතොත් මෙම අමාත්‍යාංශයේ http://203.94.94.214/csinq/ මාර්ගගත පද්ධතිය (Online System) හරහා අදළ විමසීම් සිදු කරන ලෙස ද වැඩිදුරටත් දන්වා සිටිමි.

05. උක්ත ලිපිය මගින් දැනටමත් දැනුම් දී ඇති පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් 2020.05.15 දින වන විට පවත්නා පුරප්පාඩු ප්‍රමාණය දැනුම් දුන් පසු සේවා ස්ථාන සංශෝධනය සම්බන්ධයෙන් වන ඉල්ලීම් ඉටු කිරීමේ හැකියාවක් පවතී නම් පමණක් ඒවා සිදු කිරීමට ඉදිරි සතිය (2020.05.18-2020.05.22) තුළ කටයුතු කරනු ලැබේ.

06. මෙම උපදෙස් මවිසින් නිකුත් කරනු ලබන්නේ 2018.08.20 වන දින උපාධිධාරී අභ්‍යාසලාභීන් ලෙස බඳවාගෙන සංවර්ධන නිලධාරි සේවයේ III ශ්‍රේණියට සහ ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 පන්තිය III ශ්‍රේණිය සහ 2 පන්තිය II ශ්‍රේණියට පත් කරනු ලදුව සේවා ස්ථාන සංශෝධන ඉල්ලීම් ඉදිරිපත් කර ඇති නවක පත්වීම්ලාභීන් සඳහා පමණක් අදළ වන පරිදි වන බව ද කරුණාවෙන් සලකන්න.

එස්. ආලෝකබණ්ඩාර
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්